# දළ දේශීය නිෂ්පාදිතය
# 2020 වර්ෂය සහ සිව්වන කාර්තුව - නිෂ්පාදන ප්‍රවේශය
# පදනම් වර්ෂය 2010

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

**මුදල් අමාත්‍යාංශය**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2020 වර්ෂයේ සිව්වන කාර්තුව සහ 2020 වර්ෂය සඳහා පවත්නා මිල ගණන් සහ ස්ථාවර මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතය සහ අනෙකුත් සාර්ව ආර්ථික දර්ශක ඇස්තමේන්තු කොට නිකුත් කර ඇත.

ඒ අනුව 2020 වර්ෂයේ ඇස්තමේන්තු ගත දළ දේශීය නිෂ්පාදිතය පවත්නා මිල ගණන් යටතේ සහ ස්ථාවර මිල ගණන් යටතේ පිළිවෙලින් රුපියල් මිලියන 14,972,995 ක් සහ රුපියල් මිලියන 9,530,606 ක් වශයෙන් වාර්තා වේ. 2019 වර්ෂය සඳහා මෙම වටිනාකම් පිළිවෙලින් රුපියල් මිලියන 15,012,953 ක් සහ රුපියල් මිලියන 9,883,350 ක් වශයෙන් වාර්තා විය.

- 2020 වර්ෂයේ දී කෝවිඩ්-19 වසංගතයේ බලපෑම හේතුවෙන් ශ්‍රී ලංකා ආර්ථිකය පෙර නොවූ විරූ පරිදි සියයට 3.6කින් පසුබෑමට ලක්වී ඇත.

- 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේ දී කෘෂිකාර්මික ආර්ථික කටයුතු සියයට 2.4ක්, කර්මාන්ත ආර්ථික කටයුතු සියයට 6.9ක් සහ සේවා ආර්ථික කටයුතු සියයට 1.5ක් වශයෙන් පසුබැසීමට ලක්වී ඇත.

- 2020 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතය සඳහා කෘෂිකර්මාන්ත ආර්ථික කටයුතු, කර්මාන්ත ආර්ථික කටයුතු, සේවා ආර්ථික කටයුතු සහ භාණ්ඩ හා සේවා මත අයකෙරෙන සහනාධාර අඩුකළ බදු පිළිවෙලින් සියයට 8.4ක්, සියයට 26.2ක්, සියයට 59.7ක් සහ සියයට 5.7ක් වශයෙන් දායකත්වය ලබා දී ඇත.

- 2019 වර්ෂයේ සිව්වන කාර්තුවේ දී වාර්තා වූ සියයට 1.6ක ධන වර්ධනයට සාපේක්ෂව 2020 සිව්වන කාර්තුවේ දී ශ්‍රී ලංකා ආර්ථිකය සියයට 1.3ක ධන වර්ධනයක් තවදුරටත් වාර්තා කර ඇත.

අන්තර්ගතය

2020 වර්ෂයේ ආර්ථිකයේ සාමාන්‍ය හැසිරීම - පිටුව 1
කෘෂිකාර්මික ආර්ථික කටයුතුවල වර්ධනයන් - පිටුව 4
කර්මාන්ත ආර්ථික කටයුතුවල වර්ධනයන් - පිටුව 7
සේවා ආර්ථික කටයුතුවල වර්ධනයන් - පිටුව 8
2020 සිව්වන කාර්තුවේ වර්ධනයන් - පිටුව 12

**ප්‍රකාශනයට පිවිසිය හැකි මූලාශ්‍රය**

http://www.statistics.gov.lk/NationalAccounts/StaticalInformation/Reports/Detailed_note_Annual2020_en

**1.0 2020 වර්ෂයේ ආර්ථිකයේ හැසිරීම**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2020 වර්ෂය සහ 2020 වර්ෂයේ සිව්වන කාර්තුව සඳහා පවත්නා මිල ගණන් සහ ස්ථාවර මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතය සහ අනෙකුත් සාර්ව ආර්ථික දර්ශක ඇස්තමේන්තු කොට නිකුත් කර ඇත.

2020 වර්ෂය ආරම්භ වුයේ කෝවිඩ්-19 රෝගය ගෝලීය වසංගතයක් බවට පත්වෙමින් තිබූ පසුබිමක සිටිමිනි. එහිදී බෝහෝ නැගෙනහිර ආසියානු සහ යුරෝපාකරයේ රටවල් සහ විශේෂයෙන් ඇමෙරිකා එක්සත් ජනපදය දැඩි බලපෑමකට ලක්වෙමින් පැවති අතර තවදුරටත් දැඩි බලපෑමකට ලක්වෙමින් පවතී. ශ්‍රී ලාංකීය සමාජය මුල් මාස දෙක තුළදී වෛරසයෙන් ඉහළ බලපෑමකට ලක් නොවූවත්, මාර්තු මුල සිට වෛරසය රට තුළ පැතිර යාම වේගවත් වූ අතර ඒ හේතුවෙන් මාර්තු මස මැද වන විට රට අගුළු දමන තත්ත්වයට පත් විය. එහිදි පළමු කාර්තුවේ ශ්‍රී ලංකා ආර්ථිකය සියයට 1.8ක තරමක පසුබෑමක් වාර්තා කරන ලදි.

2020 වර්ෂයේ දෙවන කාර්තුවේ දී ශ්‍රී ලංකා ආර්ථිකය වසංගතයේ දැඩි බලපෑමකට ලක්විය. එහිදි රට සම්පූර්ණ මාසයක කාලයක් සඳහා එනම් මැයි මස 26 වන දින දක්වා මුළුමනින් ම අගුළු දමා පැවති අතර විශේෂයෙන් කොළඹ සහ ගම්පහ යන ආර්ථික වශයෙන් වඩාත් ම වැදගත් දිස්ත්‍රික්ක දෙක ඇදිරි නීතිය යටතට පත්කර තිබිණි. ඒ හේතුකොටගෙන බෝහෝ ආර්ථික කටයුතු 2020 දෙවන කාර්තුවේ දී සෘණ වර්ධන වේගයන් වාර්තා කරන ලදි. ඒ අනුව එම කාර්තුවේ දී ආර්ථිකය සමස්තයක් වශයෙන් සියයට 16.4ක පසුබෑමක් වාර්තා කරන ලදි.

2020 වර්ෂයේ තෙවන කාර්තුව ආරම්භ වුයේ ව්‍යාපාර කටයුතු සහ දෛනික ජන ජීවිතය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වන වටපිටාවක සිටිමිනි. මෙම සුබදායී වතාවරණය කාර්තුව මුළුල්ලේ ම පැවති අතර එය බොහෝ ආර්ථික කටයුතු කෙරෙහි ඵලදායී ලෙස බලපාමින් 2020 තෙවන කාර්තුවේ දී ශ්‍රී ලංකා ආර්ථිකයේ සියයට 1.3 ක ධන වර්ධනයක් ඇති කිරීමට සමත්ව ඇත.

කෙසේ වෙතත් ඉතා අවාසනාවන්ත ලෙස 2020 වර්ෂයේ සිව්වන කාර්තුවේ ආරම්භයත් සමග කෝවිඩ් දෙවන රැල්ල විශේෂයෙන් බස්නාහිර පළාත කේන්ද්‍ර කරගනිමින් රට තුළ ව්‍යාප්ත වීමට පටන් ගැනුණි. එහිදි රට සම්පූර්ණයෙන් වසා දැමීමකට ලක් නොවූ අතර ජනතාවට සෞඛ්‍ය නිර්ණායක වලට අනුගත වෙමින් සාමාන්‍ය ජීවිතයක් ගත කිරීමට අවස්ථාව ලබා දී තිබුණි. කෝවිඩ් ව්‍යාප්තිය දැඩි ලෙස සිදුවූ පොලිස් බල ප්‍රදේශ සහ කෝවිඩ් හී සෘජු බලපෑමට දැඩිව ලක්වූ ආර්ථික කටයුතු ස්වල්පයක් හැරුණු විට(සංචාරක කර්මාන්තය වැනි) ජනජීවිතය සහ ආර්ථිකය බෝහෝ දුරට සාමාන්‍ය පරිදි ක්‍රියාත්මක වීම හේතුකොටගෙන 2020 වර්ෂයේ සිව්වන කාර්තුවේ දී ආර්ථිකය සියයට 1.3ක ධන වර්ධනයක් වාර්තා කිරීමට සමත් වී ඇත. පෙර වර්ෂයේ සිව්වන කාර්තුවේ දී මෙම වර්ධනය සියයට 1.6ක් ලෙස වාර්තා විය.

ඉහත සඳහන් කළ අසීරු තත්ත්වයන් යටතේ කටයුතු කළ ශ්‍රී ලංකා ආර්ථිකය 2020 වර්ෂයේ දී සියයට 3.6ක පසුබෑසිමක් වාර්තා කර ඇති අතර 2019 වර්ෂයේ දී ආර්ථිකය සියයට 2.3ක ධන වර්ධනයක් වාර්තා කර තිබිණි.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ආර්ථිකයේ සෑම අංශයක ම සෑම ආර්ථික කටයුත්තක ම හැසිරීම සමීපව නිරීක්ෂණය කරන අතර එහිදි කොවිඩ් වසංගතය නිසා ආර්ථිකයට වූ බලපෑම හඳුනා ගැනීම සඳහා පහත දැක්වෙන නව මූලාරම්භයන් ගනු ලැබ තිබේ.

- කොවිඩ් වසංගතයේ බලපෑම ව්‍යාපාරික ආයතන මට්ටමෙන් හඳුනා ගැනීම සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් කඩිනම් සමීක්ෂණයක් 2020 ජුනි මස මැද සිට ජුලි මස අග දක්වා වූ කාලයේ දී පවත්වන්නට යෙදුණි.


ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉහළ මට්ටමේ නිලධාරීන් සමග සාකච්ඡාවක් පවත්වා ඒ මගින් කෝවිඩ් ව්‍යසනය ආශ්‍රිතව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් දරන ලද අලුත් වියදම්වලින් අදාල කොටස දෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් කර ගැනීම සිදුකරන ලදි.

- ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් කොළඹ කොටස් හුවමාරුවේ ලියාපදිංචි නිමැවුම් කර්මාන්ත කටයුතු, හෝටල් සේවා, පෞද්ගලික රෝහල්, දේපොළ වෙළඳාම සහ සිල්ලර වෙළඳාම යන කටයුතු ආවරණය කෙරෙන සමාගම්වල දෙවන කාර්තුවේ ගිණුම් ප්‍රකාශන පරිශීලනය කරමින් ඒවා තුළින් හෙළිවන එම ව්‍යාපාර ආශ්‍රතව සිදුවී ඇති පසුබැසීම හඳුනා ගන්නා ලදි.
- ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් දුරකථන යොදාගනිමින් සමීක්ෂණයක් පවත්වා කෝවිඩ් වසංගතයේ බලපෑම සේවා ආර්ථික කටයුතු කෙරෙහි විශේෂයෙන් පෞද්ගලික සේවා, වෘත්තීය සේවා සහ දේපොළ වෙළඳාම් කෙරෙහි බලපෑ ආකාරය හඳුනා ගන්නා ලදි.
- ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් දත්ත රැස්කරමින් රට අගුළු දමා පැවති කාලයේ දී ජංගම වෙළඳ රථ මගින් සිදුකරන ලද සිල්ලර වෙළඳ කටයුතු සහ භාණ්ඩ ප්‍රවාහන කටයුතු පිළිබඳ දත්ත පද්ධතියක් පවත්වා ගන්නා ලදි.

ඒ අනුව උක්ත මූලාරම්භයන් මගින් රුැස්කරගන්නා ලද දත්ත, විශේෂයෙන් කෝවිඩ් -19 වසංගතයේ බලපෑම හඳුනා ගැනීම සඳහා ව්‍යාපාර ආයතන මට්ටමින් තොරතුරු රුැස් කරන ලද සමීක්ෂණයේ ප්‍රතිඵල සහ ක්‍රියාත්මක කරන ලද අනෙකුත් විශේෂ අධ්‍යයනයන් මගින් හඳුනාගත් තත්ත්වයන් 2020 වර්ෂයේ ඇස්තමේන්තු සකස් කිරීමේ දී බෙහෙවින් අදාල කර ගන්නා ලදි.

2020 දෙවන කාර්තුවේ දී, ආර්ථිකයේ ප්‍රධාන සංරචක හතර වන කෘෂිකර්මය, කර්මාන්ත, සේවා සහ භාණ්ඩ මත අය කෙරෙන සහනාධාර අඩුකළ බදු පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වයන් පිළිවෙලින් සියයට 8.4 ක්, සියයට 26.2 ක්, සියයට 59.7 ක් සහ සියයට 5.7 ක් ලෙස වාර්තා වේ. තව ද ඉතිහාසයේ පළමු වතාවට කෘෂිකර්මාන්ත ආර්ථික කටයුතු, කර්මාන්ත ආර්ථික කටයුතු සහ සේවා ආර්ථික කටයුතු යන ත්‍රිත්ව අංශයන් ම පිළිවෙලින් සියයට 2.4ක්, සියයට 6.9ක් සහ සියයට 1.5ක් වශයෙන් ඍණ වර්ධන වේගයන් 2020 වර්ෂයේ දී වාර්තා කරනු ලැබ ඇත.

**රූප සටහන 1 : වාර්ෂික ආර්ථික වර්ධන වේගයන් 2019 සහ 2020**




මෙලෙස සෑම අංශයක ම වාර්තා කරන ලද ඍණ ආර්ථික වර්ධන වේගයන් මගින් කෝවිඩ්-19 වසංගතය ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි අහිතකර ලෙස බලපා ඇති තරම හඳුනා ගත හැකි ය. එහිදි කෝවිඩ් වසංගතය විශේෂයෙන් නිමැවුම් කර්මාන්ත, ඉදිකිරීම්, පතල් හා කැනීම්, ප්‍රවාහනය, සංචාරක කර්මාන්තය, දේපොල වෙළඳාම් සහ අනෙකුත් පෞද්ගලික සේවා යන ආර්ථික කටයුතු සහ කරදිය ධීවර කටයුතු වැනි කෘෂිකර්මාන්ත ආර්ථික කටයුතු අඩාල වීම කෙරෙහි විශාල බලපෑමක් සිදු කර ඇත.

2020 වර්ෂයේ දී කෘෂිකර්මාන්ත ආර්ථික කටයුතු කිහිපයක් ම පසුබැසීම් පෙන්නුම් කරන අතර බෝහෝ කෘෂි ආර්ථික කටයුතු ධන වර්ධනයන් වාර්තා කර ඇත. තව ද කර්මාන්ත ආර්ථික කටයුතු සමස්තයක් වශයෙන් පසුබැමක් පෙන්නුම් කරන අතර සේවා ආර්ථික කටයුතු අතුරෙන් තොරතුරු තාක්ෂණ, විදුලි සංදේශ සේවා, මූල්‍ය සේවා යන ආර්ථික කටයුතු ඉහළ වර්ධනයන් වාර්තා කර ඇත. එසේ ම තැපැල් හා කූරියර් සේවා සහ සෞඛ්‍ය සේවා යන ආර්ථික කටයුතු ද ධන වර්ධනයන් වාර්තා කර ඇත.

2020 වර්ෂය සඳහා පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 14,972,995ක් සහ ස්ථාවර මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 9,530,606ක් ලෙස වාර්තා වන අතර 2019 වර්ෂයේ දී මෙම වටිනාකම් පිළිවෙලින් රුපියල් මිලියන 15,012,953ක් සහ රුපියල් මිලියන 9,883,350ක් වශයෙන් වාර්තා විය.

කෘෂිකර්මාන්ත ආර්ථික කටයුතු අතුරෙන් ධාන්‍ය වගා කිරීම, අනෙකුත් ස්ථාවර බෝග වගා කිරීම යන ආර්ථික කටයුතු පිළිවෙලින් සියයට 41.3ක් සහ සියයට 21.6ක් වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. තව ද පෙර වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේ දී උක් වගා කිරීම(සියයට 17.0), මිරිදිය ධීවර කටයුතු( සියයට 12.7), එළවළු වගා කිරීම(සියයට 10.1), පලතුරු වගා කිරීම(සියයට 6.2), වී වගා කිරීම(සියයට 5.7), රබර් වගා කිරීම(සියයට 4.6), කුළුබඩු වගා කිරීම(සියයට 3.3) වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. කෙසේ වෙතත් කරදිය ධීවර කටයුතු, පොල් වගා කිරීම, වන වගා සහ දැව සහ තේ වගා කිරීම යන ආර්ථික ක්‍රියාකාරකම් පිළිවෙලින් සියයට 21.7ක්, සියයට 10.2ක්, සියයට 8.1ක් සහ සියයට 7.1ක් වශයෙන් සෘණ වර්ධන වේගයන් වාර්තා කර ඇත.

කෝවිඩ් - 19 වසංගතයේ ආර්ථික බලපෑම වඩාත් තදින් දැණුනු කර්මාන්ත ආර්ථික කටයුතු 2020 වර්ෂයේ දි සියයට 6.9ක පසුබැසිමක් වාර්තා කර ඇත. එහිදි නිමැවුම් කර්මාන්ත කටයුතු සමස්තයක් වශයෙන් සියයට 3.9 ක සෘණ වර්ධනයක් වාර්තා කර ඇත. කෙසේ වෙතත් එහිදි ආහාර පාන සහ දුම්කොල නිෂ්පාදන, රසායනික ද්‍රව්‍ය නිෂ්පාදන පිළිවෙලින් සියයට 4.4ක් සහ සියයට 0.8ක් වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. නිමැවුම් කර්මාන්ත කටයුතු අතුරෙන් රබර් හා ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය(සියයට -17.7), ගෘහ භාණ්ඩ නිෂ්පාදනය(සියයට - 13.4),රෙදිපිළි, ඇගළුම් හා සම්භාණ්ඩ නිෂ්පාදන (සියයට - 11.9) වශයෙන් විශාල පසුබැසීම් වාර්තා කර ඇත. ජලය පිරිපහදු කිරීම ආර්ථික කටයුත්ත සියයට 4.8ක ධන වර්ධනයක් වාර්තා කර ඇති අතර ඉදිකිරීම් කර්මාන්තය සහ පතල් හා කැනීම් කර්මාන්තය පිළිවෙලින් සියයට 13.2ක් සහ සියයට 12.5ක් වශයෙන් පසුබැසීම් වාර්තා කර ඇත.

2020 වර්ෂයේ දී සේවා ආර්ථික කටයුතු අතුරෙන් විදුලි සංදේශ සේවා, මූල්‍ය සේවා සහ තොරතුරු තාක්ෂණ සේවා පිළිවෙලින් සියයට 15.4, සියයට 10.9 සහ සියයට 10.0 වශයෙන් ඉහළ ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. තව ද දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 11.7ක දායකත්වයක් සහිත තොග හා සිල්ලර වෙළදාම සියයට 1.4ක වර්ධනයක් මෙම වර්සයේ දී වාර්තා කර ඇත. දළ දේශීය නිෂ්පාදිතය සඳහා සියලුම ආර්ථික කටයුතු අතුරෙන් ඉහළ ම දායකත්වය සහිත භාණ්ඩ හා මගී ප්‍රවාහනය සහ ගබඩා පහසුකම් සැපයීම 2020 වර්ෂයේ දී සියයට 6.7ක පසුබැසීමක් වාර්තා කර ඇත. එහිදි තැපැල් හා කූරියර් සේවා, සෞඛ්‍ය සේවා, ගුවන් විදුලි හා රූපවාහිනි විකාශන කාර්යයන්, රාජ්‍ය පරිපාලනය හා ආරක්ෂාව පිළිවෙලින් සියයට 4.7ක්, සියයට 4.3ක්, සියයට 2.4ක් සහ සියයට 1.6ක් වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. කෙසේ වෙතත් අනෙකුත් පෞද්ගලික සේවා සියයට 6.5ක සෘණ වර්ධනයක් 2020 වර්ෂය සඳහා වාර්තා කරන අතරතුරදී සංචාරක කර්මාන්තය සමග ඉතා සමීපව සම්බන්ධ වන ආර්ථික කටයුත්තක් වන ආහාරපාන හා නවාතැන් පහසුකම් සැපයීම 2020 වර්ෂයේ දි තවදුරටත් සියයට 39.4ක පසුබැසීමක් වාර්තා කර ඇත.

කිසියම් වර්ෂයක ස්ථාවර මිල ගණන් යටතේ ගණනය කර ඇති දළ දේශීය නිෂ්පාදිතය හා පවත්නා මිල ගණන් යටතේ ගණනය කර ඇති දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාතය දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය මිල අවධමනකය වේ. එහි අගය

2020 වර්ෂයේ දී 157.1 ක් (2010=100) ලෙස වාර්තා වන අතර 2019 වර්ෂයේ දී එය 151.9 ක් ලෙස වාර්තා විය. ඒ අනුව දළ දේශය නිෂ්පාදිතයේ ගම්‍ය මිල අවධමනකයට අනුව 2020 වර්ෂයේ දී මිල මට්ටමේ සිදුවී ඇති ඉහළ යෑම සියයට 3.4 කි.

කොළඹ පාරිභෝගික මිල දර්ශකය (CCPI) (2013=100) 2020 වර්ෂයේ දී 135.4 ක් ලෙස වාර්තා වී ඇති අතර එය 2019 වර්ෂයේ දී 129.5 ක් ලෙස වාර්තා විය. ඒ අනුව 2019 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා මිල මට්ටමේ සිදුවී ඇති ඉහළ යෑම සියයට 4.6 කි.


### 1.1 කෘෂිකාර්මික ආර්ථික කටයුතු

බෝහෝ කෘෂිකාර්මික බෝග වගාවන් යල සහ මහ වශයෙන් කන්න දෙකක් යටතේ වගා කෙරෙන අතර යල කන්නය මැයි සිට සැප්තැම්බර් දක්වාත්, මහ කන්නය ඔක්තෝම්බර් සිට අප්‍රේල් දක්වාත් දිවේ. ඒ අනුව මෙම බෝගයන්ගේ එකතු කළ වටිනාකම් කාර්තු අනුව ඇස්තමේන්තු කිරීමේ දී අදාල සම්බන්ධිත ආයතන විසින් ලබා දෙන අවසාන ඇස්තමේන්තු සේ ම යාවකාලික ඇස්තමේන්තු ද පදනම් කර ගනී.

"කෘෂිකර්මය,වනද්‍රව්‍ය සහ ධීවර කටයුතු" සමස්තයක් වශයෙන් 2020 වර්ෂයේ පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වය සියයට 8.4 ක් වන අතර සියයට 2.4 ක පසුබැසීමක් වාර්තා කර ඇත. 2019 වර්ෂයේ දී මෙහි වර්ධනය සියයට 1.0ක් ලෙස වාර්තා වි තිබූ අතර දළ දේශිය නිෂ්පාදිතයට දක්වනු ලැබූ දායකත්වය සියයට 7.5 ක් පමණ විය.

පෙර වර්ෂයේ දී සියයට 10.5 ක පසුබැසීමක් වාර්තා කර තිබූ "ධාන්‍ය වගා කිරීම (වී හැර)" උප ආර්ථික කටයුත්ත 2020 වර්ෂයේ දී සියයට 41.3 කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කර ඇත. එහිදි කුරක්කන් නිෂ්පාදනය සියයට 40කින්, බඩඉරිඟු නිෂ්පාදනය සියයට 34කින්, මුං ඇට නිෂ්පාදනය සියයට 81කින්, කව්පි නිෂ්පාදිනය සියයට 52කින්, සෝයා බෝංචි නිෂ්පාදනය සියයට 269 කින්, කළු කව්පි නිෂ්පාදනය සියයට 110 කින්, තල නිෂ්පාදනය සියයට 40 කින් සහ රට කජු නිෂ්පාදනය සියයට 44 කින් යනාදි වශයෙන් විශාල අගයන්ගෙන් වැඩිවි තිබේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දත්ත වාර්තා අනුව බොහෝ ප්‍රධාන බෝග අපේක්ෂිත වගා බිම් ප්‍රමාණයෙන් සියයට 90කට වඩා ප්‍රගතියක් අත්කරගෙන පවතී.

**රූප සටහන 2- කෘෂිකාර්මික ආර්ථික කටයුතු වල වර්ධනයන් 2020**




'වී වගා කිරීම' උප ආර්ථික කටයුත්ත 2020 වර්ෂයේ පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වය සියයට 1.1ක් පමණ වේ. එමගින් ස්ථාවර මිල ගණන් යටතේ 2020 වර්ෂයේ දළ දේශිය නිෂ්පාදනයට රුපියල්

මිලියන 78,417 ක වටිනාකමක් එකතු කරනු ලබන අතර සියයට 5.7ක සතුටුදායක වර්ධනයක් 2020 වර්ෂයේ දී වාර්තා කර ඇත.

එළවළු වගා කිරීම උප ආර්ථික කටයුත්තේ මූර්ත දළ එකතුකළ අගය 2020 වර්ෂයේ දී පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 10.1 ක වර්ධනයක් වාර්තා කර ඇත. 2020 වර්ෂයේ මහ කන්නයේ සහ යල කන්නයේ අවසාන ඇස්තමේන්තු වලට අනුව බොහෝ එළවළු වර්ගවල නිෂ්පාදිනය වැඩිවී ඇති අතර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දත්ත අනුව 2021 වර්ෂයේ මහ කන්නයේ දී සියළුම එළවළු වර්ගයන්හිම පාහේ වගා කළ ඉඩම් ප්‍රමාණය වැඩිවී ඇත. තව ද මෙම වර්ෂයේ දී එළවළු සඳහා නිෂ්පාදකයාගේ මිල ගණන්හි ද වැඩිවීමක් දැකිය හැකි වේ.

පොල් වගාව ප්‍රධාන කොට තැඹිලි ද ඇතුලත් "තෙල් සහිත පළතුරු වගා කිරීම" උප ආර්ථික කටයුත්ත 2020 වර්ෂය සඳහා ස්ථාවර මිල ගණන් යටතේ වාර්තා කළ දළ එකතුකළ අගය රුපියල් මිලියන 60,804 ක් වේ. එමගින් පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට ලැබෙන දායකත්වය සියයට 0.7 ක් පමණ වේ. 2019 වර්ෂයට සාපේක්ෂව මෙම වර්ෂයේ දී පොල් ගෙඩි නිෂ්පාදනය මිලියන 3,086 සිට මිලියන 2,792 දක්වා අඩුවී ඇත. මෙම අඩුවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් ම බලපා ඇත්තේ පොල් ගෙඩි හටගන්නා මුල් කාලයේ පැවති ඒ සඳහා අහිතකර ලෙස බලපාන උෂ්ණසුම් කාලගුණික තත්ත්වයයි. මෙම ඇස්තමේන්තු පොල් පර්යේෂණ ආයතනයේ පුරෝකථනයක් සමග බොහෝ සෙයින් සමාන වන අතර ඒ අනුව 2020 වර්ෂයේ දී මෙම ආර්ථික කටයුත්ත සියයට 10.2ක පසුබැසීමක් වාර්තා කර ඇත. එහිදී පොල් ගෙඩියක නිෂ්පාදකයාගේ සාමාන්‍ය මිල 2019 වර්ෂයට සාපේක්ෂව රුපියල් 32 සිට රුපියල් 46 දක්වා වැඩිවී ඇති අතර පොල් ගෙඩියක සිල්ලර මිල රුපියල් 43 සිට රුපියල් 66 දක්වා වැඩිවී ඇත. තව ද පොල් අපනයනය 2020 වර්ෂයේ දී පොල් ගෙඩි දහස් 15,838ක් ලෙස වාර්තා වන අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 26ක අඩුවීමක් වාර්තා කර ඇත. එසේ ම තැඹිලි අපනයනය ද සියයට 9ක අඩුවීමක් වාර්තා කර ඇත.

"තේ වගා කිරීම" ආර්ථික කටයුත්ත 2020 වර්ෂයේ දී සියයට 7.1ක පසුබැසීමක් වාර්තා කර ඇත. එහිදි සමස්ත තේ නිෂ්පාදනය සියයට 7.1කින් අඩුවී ඇත. සමස්ත තේ නිෂ්පාදනයෙන් සියයට 61ක පමණ දායකත්වයක් සහිත පහතරට තේ නිෂ්පාදනය සියයට 10.5ක පසුබැසීමක් මෙම වර්ෂයේ දි වාර්තා කර ඇත. ජනවාරි මස අවසානයේ සිට මාර්තු මස දක්වා තේ වගා කෙරෙන ප්‍රදේශවල පැවති තේ වගාවට අයහපත් ලෙස බලපෑ කාලගුණික තත්ත්වය මෙම නිෂ්පාදනයේ අඩුවීම කෙරෙහි බලපා ඇත. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ වාර්තා වලට අනුව 2020 වර්ෂයේ දී තේ කිලෝග්රෑම් මිලියන 265.6ක් අපනයනය කර ඇති අතර එය සියයට 9.3ක අඩුවීමක් වාර්තා කර ඇත. තව ද කොළඹ තේ වෙන්දේසියේ තේ කිලෝග්රෑමයක වාර්ෂික සාමාන්‍ය මිල රුපියල් 626.6 දක්වා 2020 වර්ෂයේ දී වැඩිවී ඇති අතර එය 2019 වර්ෂයේ දී රුපියල් 543.8ක් ලෙස වාර්තා විය.

"රබර් වගාව" උප ආර්ථික කටයුත්ත 2020 වර්ෂයේ දී සියයට 4.6ක ධන වර්ධනයක් වාර්තා කර ඇත. මෙමගින් ස්ථාවර මිල ගණන් යටතේ 2020 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතයට එකතු කෙරෙන වටිනාකම රුපියල් මිලියන 23,831ක් වන අතර මෙය පවත්නා මිල ගණන් යටතේ 2020 වර්ෂයේ දළ දේශිය නිෂ්පාදිතයට සියයට 0.1ක දායකත්වයක් ලබා දෙනු ලැබේ. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ වාර්තාවලට අනුව, 2020 වර්ෂයේ දී සකස් කළ රබර් කිලෝ ග්‍රෑමයක් සඳහා අවශ්‍ය ලේටෙක්ස් වල සාමාන්‍ය මිල සියයට 8.1කින් වැඩිවී ඇත.

"අනෙකුත් ස්ථාවර බෝග වගා කිරීම" උප ආර්ථික කටයුත්ත පුවක් වගා කිරීම, බුලත් වගා කිරීම, කොට්ට කිලංගු වගා කිරීම, කොස් වගා කිරීම, දෙල් වගා කිරීම සහ රා මැදීම යන ආර්ථික ක්‍රියාකාරකම්වල එකතුවෙන් සමන්විත වේ. 2020 වර්ෂයේ දී මෙහි සියයට 1.8ක ධන වර්ධනයක් වාර්තා වන අතර එහිදි බුලත් වගා කිරීම, පුවක් වගා කිරීම, කොස් වගා කිරීම සහ දෙල් වගා කිරීම යන ක්‍රියාකාරකම්වල නිෂ්පාදනය පිළිවෙලින් සියයට 2.7ක්, සියයට 19.3ක්, සියයට 1.4ක්, සියයට 17.3ක් යනාදි වශයෙන් වැඩිවී ඇත. තව ද රා නිෂ්පාදනය මෙම වර්ෂයේ දී සියයට 2.4කින් අඩුවී ඇත.

'සත්ත්ව නිෂ්පාදන' ක්‍රියාකාරකම කිරි නිෂ්පාදනය, බිත්තර නිෂ්පාදනය, මස් පිණිස සතුන් ඇති කිරීම යනාදියෙන් සමන්විත වේ. මෙම ආර්ථික කටයුත්ත පසුගිය වර්ෂ 10ක කාලය තුළ වාර්තා කරන ලද අඩුම වර්ධන වේගය ලෙස සැලකිය හැකි සියයට 4.9ක පසුබෑසීමක් 2020 වර්ෂයේ දී වාර්තා කර ඇත. තව ද මෙම වර්ෂයේ දී මුලින් නිකුත් කළ කාර්තුගත දත්ත කොවිඩ් ව්‍යසනය සමග මතුවූ බිම් මට්ටමේ දත්ත එකතු කිරීමේ දුෂ්කරතා සහිතව රැස්කර ඇති නිසා වර්ෂයට අදාල දත්ත ලැබීමෙන් පසු යාවත්කාලීන කිරීමට සිදුවී ඇති බව සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වාර්තා කර ඇත. ඒ අනුව හරක් මස් නිෂ්පාදනය, ඌරු මස් නිෂ්පාදනය සහ කුකුල් මස් නිෂ්පාදනය පිළිවෙලින් සියයට 29.1ක්, සියයට 4.1ක් සහ සියයට 3.5ක් වශයෙන් පහත වැටී ඇත. මෙම වර්ෂයේ දී කෝවිඩ්-19 ව්‍යසනය සමග සංචාරක කර්මාන්තයේ ඇතිවූ පසුබෑසීම සත්ව නිෂ්පාදනය අඩුවීමට බලපා ඇති බව පැහැදිලිය. තව ද ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන වාර්ෂික සමීක්ෂණයේ දත්ත අනුව රටේ කිරි නිෂ්පාදනය වැඩිවී ඇති අතර බිත්තර නිෂ්පාදනය අඩුවී ඇත.

පැළ බෝ කිරීම සහ කෘෂිකාර්මික සහය සේවා කාර්යයන් ප්‍රධාන වශයෙන් ම බීජ නිෂ්පාදනය සහ වන වගා සඳහා වන පැළ හැර අනෙකුත් වර්ගවල පැළ බෝ කිරීම සහ වී වගා කිරීම හැර අනෙකුත් කෘෂිකාර්මික කටයුතු සඳහා ශ්‍රමිකයන් යොදවා ගැනීම යන කටයුතුවලින් සමන්විත වේ. එහිදි මෙම ආර්ථික කටයුත්ත 2020 වර්ෂයේ දී සියයට 0.5 ක පසුබෑසීමක් වාර්තා කර ඇති අතර මෙහිදි පැළ බෝ කිරීම ප්‍රධාන වශයෙන් ම පොල්, තේ, රබර් හා පළතුරු පැළ වලින් සමන්විත වන අතර මෙම සෑම අයිතමයක ම පැළ බෝ කිරීම මෙම වර්ෂයේ දී පහත වැටී ඇත.

වන සම්පත් සහ දැව කඳන් නිෂ්පාදන ආර්ථික කටයුත්ත 2020 වර්ෂයේ දි සියයට 8.1ක පසුබෑසීමක් වාර්තා කර ඇත. මෙමගින් පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 0.7ක පමණ දායකත්වයක් ලැබෙන අතර මෙම වර්ෂයේ පළමු කාර්තු තුන තුළදී කෝවිඩ්-19 බලපෑම නිසා දැව කඳන් නිෂ්පාදනය විශාල වශයෙන් අඩුවීම මෙම ආර්ථික කටයුත්තේ වාර්තා වන පසුබෑසීම සඳහා මුලික වශයෙන් ම බලපා ඇත.

2020 වර්ෂයේ දී කරදිය මත්ස්‍ය නිෂ්පාදනය ආර්ථික කටයුත්තේ මගින් දළ දේශීය නිෂ්පාදිතයට රුපියල් මිලියන 135,409ක වටිනාකමක් එකතුකර ඇති අතර එය සමස්ත දළ දේශිය නිෂ්පාදිතයෙන් සියයට 0.9ක් පමණ වේ. මෙහිදි මෙම ආර්ථික කටයුත්ත සියයට 21.7ක පසුබෑසීමක් 2020 වර්ෂයේ දී වාර්තා කර ඇත. ධිවර අමාත්‍යාංශයේ වාර්තා වලට අනුව 2020 වර්ෂයේ දී ගැඹුරු දිය මත්ස්‍ය නිෂ්පාදනය සියයට 16.5ක අඩුවීමක් සහ වෙරළ කලාප මත්ස්‍ය නිෂ්පාදනය සියයට 24.7 ක අඩු වීමක් වාර්තා කර ඇත. මෙම අඩුවීම වර්ෂය පුරා බලපාන ලද කෝවිඩ් ව්‍යසනයේ බලපෑම නිසා සිදුවී ඇති අතර විශේෂයෙන් බස්නාහිර පළාත ආශ්‍රිතව ඔක්තෝබර් මාසයේ සිට පැතිර ගිය දෙවන කෝවිඩ් රැල්ල සමග පෑළියගොඩ මත්ස්‍ය තොග වෙළඳපොළ තාවකාලිකව වසා දැමීම සමග බොහෝ ධීවර වරායන්ගේ ද කටයුතු අඩපණ වීම නිසා රට පුරා මත්ස්‍ය බෙදාහැරීම් ජාලය බිඳවැටීම මෙම පසුබෑසීම කෙරෙහි බලපා ඇත. තව ද වෙරළ කලාප ආශ්‍රිතව බලපෑ අයහපත් කාලගුණික තත්ත්ව සමග විටින් විට නිකුත් කරන ලද කාලගුණික අනතුරු ඇඟවීම් නිසා මත්ස්‍ය නිෂ්පාදනයේ යෙදීම අඩුවීම ද මෙම පසුබෑසීම කෙරෙහි බලපා ඇත.


කෙසේ වෙතත් 2020 වර්ෂයේ දී මිරිදිය ධිවර නිෂ්පාදනය සියයට 12.7කින් පමණ වර්ධනය වී ඇත. එය 2019 වර්ෂයේ දී වාර්තා වන ලද සියයට 3.0ක වර්ධනය ද ඉක්මවා යැමකි.

### 1.2 කර්මාන්ත ආර්ථික කටයුතු

කර්මාන්ත ආර්ථික කටයුතු 2019 වර්ෂයේ දි සියයට 2.6ක ධන වර්ධනයක් වාර්තා කර පැවති අතර 2020 වර්ෂයේ දී සියයට 6.9ක විශාල පසුබෑසීමක් වාර්තා කර ඇත. කර්මාන්ත ආර්ථික කටයුතු දළ දේශීය නිෂ්පාදිතයේ හතරෙන් එකක පමණ දායකත්වයක් සපයන අතර 2020 වර්ෂයේ පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට එකතුකරනු ලබන වටිනාකම රුපියල් මිලියන 3,930,042ක් පමණ වේ.

සමස්ත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.2 ක් නියෝජනය කරන පතල් හා කැනීම් ආර්ථික කටයුත්ත, 2020 වර්ෂයේ දි සියයට 12.5ක පසුබැසීමක් වාර්තා කර ඇත. පතල් හා කැනීම් ආර්ථික කටයුත්ත ආර්ථික ක්‍රියාකාරකම් 3 ක් වන ඉදිකිරීම් අමුද්‍රව්‍ය කැනීම්, මැණික් කැනීම් හා අනෙකුත් අමුද්‍රව්‍ය කැනීම් වලින් සමන්විත වේ. සමස්ත පතල් හා කැනීම් ආර්ථික කටයුත්ත සඳහා මෙම ආර්ථික කටයුතු තුන අතරින් ඉහළම එකතු කළ වටිනාකම ඉදිකිරීම් අමුද්‍රව්‍ය කැනීම මගින් ලැබෙන අතර එය 2020 වර්ෂයේ දි සියයට 10.9ක අඩුවීමක් වාර්තා කර ඇත. තව ද මැණික් කැනීම මගින් එකතුකෙරෙන වටිනාකම සියයට 51.9කින් පමණ අඩුවී ඇත. ඉදිකිරීම් කර්මාන්තයේ වාර්තා වී ඇති පසු බැසීම පතල් හා කැනීම් අංශයේ සෘණ වර්ධන අනුපාතයක් වාර්තා වීමට සෘජුවම බලපා ඇත.

**රූපසටහන 3 කර්මාන්ත ආර්ථික කටයුතු වල වර්ධනයන් 2020**




### 1.2.1 නිමැවුම කර්මාන්ත කටයුතු

2020 වර්ෂයේ දී සමස්ත නිමැවුම් ආර්ථික කටයුතු සියයට 3.9ක පසුබැසීමක් වාර්තා කර ඇති අතර එහිදි බොහෝ උප නිමැවුම් ආර්ථික කටයුතු අඩු වැඩි වශයෙන් පසුබැසීම් මෙම වර්ෂයේ දි වාර්තා කර ඇත.

2020 වර්ෂයේ දී ආහාර පාන සහ දුම්කොළ නිෂ්පාදනය සියයට 4.4ක ධන වර්ධන වේගයක් වාර්තා කර තිබිම කැපි පෙනේ. මෙමගින් දළ දේශීය නිෂ්පාදිතයට ස්ථාවර මිල(2010) ගණන් යටතේ රුපියල් මිලියන 599,902ක් පමණ එකතුකරනු ලබන අතර දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6.3ක පමණ දායකත්වයක් උසුලනු ලැබේ.

රෙදිපිළි ඇගළුම් හා සම්භාණ්ඩ නිෂ්පාදනය 2020 වර්ෂයේ දි සියයට 11.9ක පසුබැසීමක් වාර්තා කර ඇති අතර ඒ සඳහා රට අගුළු දමා පැවතීම සහ ගෝලීය වශයෙන් පැවති අඩු ඉල්ලුම බලපා ඇති බව ඉහළ තිව්‍රතාවයක් සහිතව ප්‍රකාශයට පත්වන ආර්ථික දර්ශක මගින් පෙන්නුම් කෙරේ.

මෙම කාලසීමාව තුළ අනෙකුත් සියලුම නිෂ්පාදන කර්මාන්ත කටයුතු සැළකිල්ලට ගත් විට ඒ සියල්ලක ම පාහේ පසු බැසීම් වාර්තා වී ඇත. ඒ අනුව ගෘහ භාණ්ඩ හැර දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය සියයට 7.9 ක පසුබැසීමක් ද , කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන මුද්‍රණ කටයුතු සහ දෘශ්‍ය හා ශ්‍රවණ තැටි නැවත නිෂ්පාදන කර්මාන්තය සියයට 2.3

පසුබැසීමක් ද , ගල් අඟුරු සහ ඛනිජ තෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන කර්මාන්තය සියයට 10.9 පසුබැසීමක් ද , රබර් හා ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය සියයට 17.7 ක පසුබැසීමක් ද , ලෝහ නොවන වෙනත් ඛනිජ ද්‍රව්‍ය නිෂ්පාදන කර්මාන්තය සියයට 4.1 ක පසුබැසීමක් ද , මූලික ලෝහ හා ව්‍යුහාත්මක ලෝහ නිෂ්පාදන කර්මාන්තය සියයට 2.8 ක පසුබැසීමක් ද , යන්ත්‍රෝපකරණ නිෂ්පාදන කර්මාන්තය සියයට 2.5 ක පසුබැසීමක් ද , ගෘහ භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය සියයට 13.4 ක පසුබැසීමක් ද , වෙනත් නිෂ්පාදන යන්ත්‍රෝපකරණ අලුත් වැඩියාව හා සවි කිරීම් නිෂ්පාදන කර්මාන්තය සියයට 7.2 ක පසුබැසීමක් ද 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේ දී වාර්තා කර ඇත.

විදුලිය, ගෑස්, උණුසුම් වායු සැකසුම් සැපයුම 2020 වර්ෂයේ දි සියයට 1.6ක පසුබැසිමක් වාර්තා කර ඇත. එහිදි විදුලිය ජනනය 2019 වර්ෂයේ පැවති ගිගාවෝට් පැය 15,777 සිට ගිගාවෝට් පැය 15,540 දක්වා අඩුවි ඇත. තව ද 2020 වර්ෂයේ දී කර්මාන්ත ආශ්‍රිතව විදුලිය පරිභෝජනය අඩුවීමක් දැකිය හැකි වේ.

ජලය එක්රැස්කිරිම, පිරිපහදු කිරීම සහ බෙදා හැරීම ආර්ථික කටයුත්ත 2020 වර්ෂයේ දි සියයට 4.8ක වර්ධනයක් වාර්තා කර ඇත. එහිදි පිරිපහදු කළ ජලය ප්‍රමාණය 2019 වර්ෂයේ පැවති කියුබික් මීටර් 746,195 සිට කියුබික් මීටර් 781,042 දක්වා වැඩිවි ඇත. තව ද ජලය අලෙවි ආදායම ද සියයට 4.3ක වැඩිවීමක් වාර්තා කර ඇත.

2020 වර්ෂයේ දී කෝවිඩ් ව්‍යසනයේ පැතිර යාම ඉදිකිරිම් කර්මාන්ත කටයුතු කෙරෙහි දැඩි අහිතකර බලපෑම් ඇතිකර තිබේ. ඒ අනුව 2020 වර්ෂයේ දී ඉදිකිරිම් කර්මාන්තය සියයට 13.2ක පසුබැසිමක් වාරතා කර ඇත. එහිදි සමස්ත සිමෙන්ති සැපයුම සියයට 11.4ක අඩුවිමක් වර්ෂය තුළදී වාර්තා වි ඇත. තව ද ඉදිකිරිම් අමුද්‍රව්‍ය ආනයනය සියයට 26 කින් අඩුවී ඇති අතර ඉදිකිරීම් කටයුතු වල පිරිවැය පෙන්නුම් කරන දර්ශකය සියයට 2.6ක වැඩිවිමක් වාර්තා කර ඇත.

**1.3 සේවා ආර්ථික කටයුතු**

2020 වර්ෂයේ දී සේවා ආර්ථික කටයුතු සමස්තයක් වශයෙන් සියයට 1.5ක පසුබැසිමක් වාර්තා කර ඇති අතර දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වය සියයට 59.7ක් පමණ වේ. 2019 වර්ෂයේ දි සේවා අංශය සමස්තයක් වශයෙන් වාර්තා කර තිබූ වර්ධනය සියයට 2.2 ක් වන අතර දළ දේශීය නිෂ්පාදිතයට ලබා දී ඇති දායකත්වය සියයට 58.1කි.

"තොග සහ සිල්ලර වෙළඳාම" සේවා ආර්ථික කටයුත්ත 2020 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතය සඳහා සියයට 11.7 ක පමණ දායකත්වයක් ලබා දී ඇති අතර 2019 වර්ෂයේ වාර්තාවූ සියයට 3.0 ක වර්ධනය හා සැසඳීමේදී 2020 වර්ෂයේ දී සියයට 1.4 ක වර්ධනයක් වාර්තා කර ඇත. කෝවිඩ් -19 වසංගතයේ පළමු රැල්ලට පසු නව සාමාන්‍යකරනයත් සමග 2020 තුන්වන කාර්තුව පුරාම රට තුළ ව්‍යාපාරික කටයුතු හා ජනතාවගේ එදිනෙදා ජීවන රටාවන් සාමාන්‍ය තත්ත්වයට පත්වෙමින් තිබූ අතර තුර කෝවිඩ් -19 වසංගතයේ දෙවන රැල්ල තුන්වන කාර්තුව අවසනයේ ආරම්භ වුවත් තොග හා සිල්ලර වෙළඳ ක්‍රියාකාරකම් මෙම වර්ෂයේදී සියයට 1.4 ක ධනාත්මක වර්ධනයක් වාර්තා කර ඇත.

තොග හා සිල්ලර වෙළඳාම යටතේ ආහාර හා ආහාර නොවන අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ වෙළඳාම මෙන්ම ඇඳුම්, පාවහන් හා උපාංග, විලාසිතා සහ ආභරණ, ඉලෙක්ට්‍රොනික උපකරණ, ගෘහ භාණ්ඩ හා දිගුකාලීන පරිභෝජන භාණ්ඩ, විනෝදාස්වාදය, නවාතැන් හා නිවාස යනාදි අංශ ද ආවරණය කරයි.


ආනයනවල වෙනස් වීම සහ දේශීය නිෂ්පාදිතයේ වෙනස් වීම තොග හා සිල්ලර වෙළඳාම උප ආර්ථික කටයුත්ත මගින් දළ දේශීය නිෂ්පාදිතයට එකතුකෙරෙන වටිනාකම තීරණය වීමට බලපානු ලැබේ. එබැවින් තොග හා සිල්ලර වෙළඳාම උප ආර්ථික කටයුත්තේ වර්ධන වේගය ආනයන, දේශීය කෘෂිකාර්මික නිෂ්පාදනය සහ දේශීය කාර්මික නිෂ්පාදනය යන විචල්‍යයන්හී වෙනස්වීම මත රඳා පවතී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) බාහිර වෙළඳ සංඛ්‍යාලේඛනවලට අනුව 2019 වර්ෂය සඳහා සමස්ත ආනයන වියදම රු.මිලියන 3,565,028 වු අතර 2020 වර්ෂය සඳහා එය මිලියන 2,974,915දක්වා සියයට 16.55 කින් අඩු වී ඇත. එසේම, මෙම වර්ෂය දී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම 2019 වර්ෂයේ පැවති රු. මිලියන 707,594 සිට රු. මිලියන 631,052

දක්වා සියයට 10.82 කින් අඩු වී ඇත . ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද වෙළඳ දර්ශකවලට අනුව, 2019 වර්ෂය හා සසඳන විට 2020 වර්ෂය දී පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා දර්ශකය සියයට 12.0 කින් අඩු වී ඇති අතර, සමස්ත ආනයන පරිමා දර්ශකය සියයට 11.4 කින් අඩු වී තිබේ. එසේ ම, 2020 වර්ෂය දී කාර්මික නිෂ්පාදනයේ සමස්ත වෙළඳ ආන්තික වටිනාකම 2019 හා සසඳන විට 1,199,003 සිට රුපියල් මිලියන 1,210,970 දක්වා සියයට 1.0 කින් වර්ධනය වී තිබේ.

මීට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) බාහිර වෙළඳ සංඛ්‍යාලේඛනවලට අනුව, 2019 වර්ෂය හා සසඳන විට 2020 වර්ෂය ලෝකයේ සෙසු රටවල් සඳහා වන මුළු අපනයන වටිනාකම සියයට 12.7 කින් අඩු වී තිබේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) වෙළඳ දර්ශකයන්ට අනුව සමස්ත අපනයන පරිමා දර්ශකය ද සියයට 9.6 කින් අඩු වී තිබේ. එහිදී කාර්මික අපනයන පරිමා දර්ශකය සහ කෘෂිකාර්මික අපනයන පරිමා දර්ශකය මෙම වර්ෂය දී පිළිවෙලින් සියයට 10.0කින් සහ සියයට 7.4 කින් අඩු වී ඇත.

**රූපසටහන 4 සේවා ආර්ථික කටයුතු වල වර්ධනයන් 2020**




"මගීන් සහ භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම" යන ක්‍රියාකාරකම, භාණ්ඩ හා සේවා ගොඩබිම් ප්‍රවාහනය, මුහුදු මාර්ග වල ප්‍රවාහනය සහ ගුවන් සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම යන උප ආර්ථික කාර්යයන් ගෙන් සමන්විත වේ. 2020 වර්ෂයේ දී මෙහි සමස්තයක් වශයෙන් සියයට 6.7ක පසුබැසීමක් වාර්තා වේ. සමස්ත ප්‍රවාහන ආර්ථික කටයුත්තේ සියයට 94ක දායකත්වයක් සහිත ගොඩබිම් භාණ්ඩ හා මගී ප්‍රවාහනය 2020 වර්ෂයේ දී සියයට 6.0ක පසුබැසීමක් වාර්තා කර ඇත. තව ද ගුවන් ප්‍රවාහනය(සියයට 35.0), නාවික ප්‍රවාහනය(සියයට 19.0) සහ ගබඩා පහසුකම් සැපයීම සහ අනෙකුත් ප්‍රවාහන සහය සේවා(සියයට 3.8) වශයෙන් පසුබැසීම් වාර්තා කර ඇත. 2020 වර්ෂයේ දී මෙමගින් ජනනය කෙරුණ එකතුකළ වටිනාකම රුපියල් බිලියන 1616 ක් පමණ වන අතර එය දළ දේශිය නිෂ්පාදිතයෙන් සියයට 10.8ක පමණ දායකත්වයක් උසුලනු ලබයි. විශේෂයෙන් 2019 වර්ෂයේ දී ප්‍රවාහන සේවා සියයට 1.4 ක ධන වර්ධනයක් වාර්තා කර තිබු අතර 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේ දී කෘෂිකාර්මික වාහන හැර අනෙකුත් සියලුම වාහන වර්ගවල අලුතින් ලියාපදිංචි කිරීම් අඩුවී ඇත.

2020 වර්ෂයේ දී තැපැල් හා කූරියර් සේවා උප ආර්ථික කටයුත්ත සියයට 4.7ක ධන වර්ධන වේගයක් වාර්තා කර ඇත. තැපැල් දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව එහි සමස්ත පිරිවැය සියයට 27කින් අඩුවී ඇති අතර කූරියර් සේවාවන්ගේ ක්‍රියාකාරීත්වය පෙන්නුම් කෙරෙන දර්ශක 2020 වර්ෂයේ දී ධනාත්මක හැසිරීමක් පෙන්නුම් කර ඇත.

2019 වර්ෂයේ දී පාස්කු ඉරිදා ප්‍රහාරයේ අහිතකර බලපෑමට ලක් වූ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ ප්‍රධානතම අංශය වන නවාතැන්, ආහාර හා පාන වර්ග සැපයීම ආර්ථික කටයුත්ත 2020 වර්ෂයේ ව්‍යාප්ත වූ කොවිඩ් වසංගතය හේතුවෙන් තව දුරටත් පසුබැසීමට ලක්විය. කෝවිඩ් වසංගතය ගෝලීයව ව්‍යාප්ත වීමත් සමඟ දිවයිනට පැමිණෙන සියලුම මගී ගුවන් ගමන් ශ්‍රී ලංකා රජය විසින් තහනම් කරන ලදී. මෙය ජාත්‍යන්තර සංචාරකයින්ගේ පැමිණීම ශූන්‍ය ලෙස වාර්තා කිරීමට ද හේතු විය. මීට අමතරව, 2020 මාර්තු මස මුල දී ශ්‍රී ලංකාවේ කොරෝනා වසංගතයේ පළමු රැල්ල පැතිරීම හේතුවෙන් රජය විසින් රට පුරා අගුලු දැමීමේ සීමාවන් පනවන ලදී. මෙය දේශීය සංචාරක කර්මාන්තයේ ද කඩාවැටීමට හේතු විය. කෙසේ වෙතත්, පළමු රැල්ලෙන් පසු, රටේ සුඛෝපභෝගී හෝටල් බොහොමයක් විසින්, දේශීය සංචාරකයින් සඳහා ආකර්ශනීය ප්‍රවර්ධන පැකේජ හඳුන්වාදීම තුලින් දේශීය සංචාරකයින්ගේ ආකර්ෂණය ලබා ගැනීමට සමත් වූ අතර, එමඟින් කර්මාන්තයේ පිරිවැටුම පහත වැටීම යම් දුරකට අඩු කරගැනීමට හැකි විය. කොරෝනා වසංගතයේ දෙවන රැල්ල පැතිරීමත් සමඟ නැවතත් සංචාරක හෝටල් කර්මාන්තය පවත්වාගෙන යෑම අර්බුදකාරී තත්වයට පත් විය. එබැවින් සමස්තයක් ලෙස 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේ දී මෙම කර්මාන්තයේ එකතුකළ වටිනාකම සියයට 39.2 කින් විශාල ලෙස පහත වැටී ඇත. 2020 වර්ෂයේ ශ්‍රී ලංකාවේ කොළඹ කොටස් වෙළඳපොලේ ලියාපදිංචි වී ඇති ලැයිස්තුගත හෝටල් සමාගම්වල කාර්තුමය මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2020 වර්ෂය තුළ එම හෝටල්වල වාර්ෂික පිරිවැටුම 2019 වර්ෂයේ පිරිවැටුම හා සසඳන විට සියයට 53 කින් අඩු වී තිබේ.

වැඩසටහන් සකස් කිරීම, විකාශන කාර්යයන්, ශබ්ද පටිගත කිරීම හා වීඩියෝ නිෂ්පාදනය කිරීම සේවා ආර්ථික කටයුත්ත 2020 වර්ෂයේ දී පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 2.4 වර්ධනයක් වාර්තා කර ඇත. කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ විනෝදාශ්වාද උප දර්ශකය පසුගිය වර්ෂයේ වාර්තා වූ 119.4 සිට මෙම වර්ෂයේ දී 109.7 දක්වා අඩුවී ඇති අතර මෙම විකාශන කාර්යයන් ආර්ථික කටයුත්තට අදාල වෙළඳ ආයතනවල මුළු වියදමේ අඩු වීමක්ද මෙම වර්ෂය තුළ වාර්තා වී ඇත.

2020 වර්ෂයේ දී සේවා ආර්ථික කටයුතු අතුරෙන් වැඩි ම වර්ධනය වාර්තා කර ඇත්තේ විදුලි සංදේශ සේවා සැපයීම උප ආර්ථික කටයුත්ත මගිනි. එය 2020 වර්ෂය සඳහා 15.4ක් ලෙස වාර්තා වන අතර මෙම අංශයේ වෙළඳ ආයතනවල මූල්‍ය වාර්තා අනුව බහුතරයක් ආයතන ඒවායේ ආදායමේ වැඩිවීමක් වාර්තා කර ඇත. තව ද විදුලි සංදේශ නියාමන කොමිසමේ දත්ත වාර්තා අනුව දත්ත භාවිතයෙන් සිදුකරනු ලබන සේවා සම්බන්ධතා 2020 වර්ෂයේදී සියයට 31.0ක ඉහළ යෑමක් වාර්තා කර ඇත.

ශ්‍රී ලංකාවේ නැගී එන ප්‍රධාන සේවා කටයුත්තක් වන ‘තොරතුරු තාක්ෂණ වැඩසටහන් සහ උපදේශනය’ 2020 වර්ෂයේ දී කොවිඩ් -19 වසංගතය මධ්‍යයේ වුවද සියයට 10.0ක සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරයි. මෙය 2020 වර්ෂයේ සෑම කාර්තුවකම පාහේ සැලකිය යුතු ධන වර්ධන වේගයක් වාර්තා කර ඇත. මෙම සේවාව සැපයීම බොහෝ ආයතන වලට නිවසේ සිට වැඩ කිරීමේ සංකල්පය අනුගමනය කරමින් අවම බාධා සහිතව කරගෙන යාමට හැකි විය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරනු ලබන ගෙවුම් ශේෂය සංඛ්‍යාලේඛන අනුව, පරිගණක සේවාවන්ගෙන් ලද අපනයන ආදායමේ වටිනාකම සියයට 12.2 කින් එනම් මෙම කාලය තුළ රු.මිලියන 160,602 සිට රු. මිලියන 180,201 දක්වා ඉහළ ගොස් තිබේ.

‘මූල්‍ය සේවා සැපයීම” ආර්ථික කටයුත්ත සඳහා බලපත්‍රලත් වාණිජ බැංකු (එල්සීබී), බලපත්‍රලත් විශේෂිත බැංකු (එල්එස්බී), වෙනත් ලියාපදිංචි මූල්‍ය සමාගම්, ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ කොටස් හුවමාරුව (සීඑස්ඊ) සහ ශ්‍රී ලංකාවේ ගෘහ අංශය නියෝජනය කරන පුද්ගලයින් විසින් සපයනු ලබන මූල්‍ය සේවා අයත් වේ. මෙම ආර්ථික කටයුත්ත 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේ දී සියයට 10.9 ක වර්ධනයක් වාර්තා කර ඇත. මේ වසරේදී ස්ථාවර මිල ගණන් යටතේ

එකතුකළ අගය රුපියල් මිලියන 778,258 ක් අතර එය 2019 වර්ෂයේ වාර්තා වූ රුපියල් මිලියන 721,891 ට වඩා ඉහළ අගයක් ගනී. මූල්‍ය සේවාවන්හි භාවිතාව, ණය සහ අත්තිකාරම් වටිනාකම සහ මුළු තැන්පතු වටිනාකම මගින් පෙන්නුම් කරයි. ඒ අනුව ණය අත්තිකාරම් වටිනාකම සහ මුළු තැන්පතු වටිනාකම 2020 වර්ෂයේ පිළිවෙලින් සියයට 11.9 කින් සහ 21.6 කින් වර්ධනය වී ඇත. 2020 වර්ෂයේ "හරිත සාමාන්‍ය ණය පොලී අනුපාතය " සහ "හරිත සාමාන්‍ය තැන්පතු පොලී අනුපාතය " පිලිවෙලින් සියයට 10.2 ක් සහ සියයට 5.8 ක් ලෙස සටහන් විය.

රක්ෂණ සේවා සැපයීම සහ විශ්‍රාම වැටුප් අරමුදල් කළමනාකරණය කිරීමේ කටයුතු වල මූර්ත එකතුකළ අගය 2020 වර්ෂයේ දී සියයට 0.6ක වර්ධනයක් වාර්තා කර ඇත. මෙමගින් දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වය සියයට 1.4ක් ලෙස වාර්තා වන අතර මෙම වර්ෂයේ දි රක්ෂණ සමාගම් වල සේවක ගෙවීම් සහ බදු පෙර ලාභයෙහි සියයට 15.8 ක වර්ධනයක් වාර්තාවී ඇත. 2019 වසරට සාපේක්ෂව 2020 වසරේදී සාමාන්‍ය රක්ෂණ කොටසේ ලාභදායිතාවයේ සියයට 130 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා වී ඇති අතර උපයන ලද හිමිකම් වටිනාකමේ සිදුවූ විශාල පහළයාම (සියයට 30 ක) මේ සඳහා මූලිකව බලපා ඇත. රක්ෂණ සේවාව භාවිතා කල ප්‍රමාණය මැන දක්වන උපයන ලද රක්ෂණ වාරික වටිනාකම සියයට 6.3 ක වර්ධනයක් සහ උපයන ලද හිමිකම් වටිනාකම සියයට 15.3 ක පසුබෑස්මක් 2020 වසරේදී වාර්තා කර ඇත. නමුත් වර්ෂය තුළදී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ උපයන ලද රක්ෂණ වාරික වටිනාකමේ රුපියල් බිලියන 2 ක අඩුවීමක් පෙන්නුම් කරයි. රජය විසින් 2020 වසරේදී දැඩි ආනයන සීමා පැනවීම සමග නව මෝටරථ ලියාපදිංචියේ සිදුවී ඇති අඩුවීම මේ සඳහා මූලිකව බලපා ඇත.

"නිවාස අයිතිය සහ දේපළ වෙළඳාම් කාර්යයන්" 2020 වර්ෂයේදී මුළු දළ දේශීය නිෂ්පාදිතයට සියයට 6.2 ක දායකත්වයක් සපයනු ලබයි. 2020 වර්ෂයේ දෙවන කාර්තුවේ පළමු මාස දෙක තුළදී කොවිඩ් -19 ව්‍යසනය සමග රටේ පැවති තත්ත්වය මෙම ආර්ථික කටයුත්ත කෙරෙහි දැඩිව බලපා ඇත. එබැවින් 2020 වසර තුළ සමස්ත වර්ධන වේගය 2019 වර්ෂයේ වාර්තා වූ සියයට 2.4 ක ධන වර්ධන වේගය හා සැසඳීමේදී වාර්තා වන්නේ සියයට 1.2ක පසුබැසීමක් වශයෙනි.

"වෘත්තීය සේවා" 2020 වර්ෂයේ දී සියයට 2.7ක පසුබැසීමක් වාර්තා කර ඇත. මෙහි එකතුකළ අගය ගණනය කරනු ලබන්නේ ආර්ථික ක්‍රියාකාරකම් 8 ක එකතුවක් ලෙසිනි. මෙය ප්‍රධාන වශයෙන් " නීති හා ගිණුම් කාර්යයන්", "ගෘහනිර්මාණ හා ඉංජිනේරු කාර්යයන්", " විද්‍යාත්මක පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන්" "ප්‍රචාරණ හා අලෙවි පර්යේෂණ, වෙනත් වෘත්තීය, විද්‍යාත්මක හා තාක්ෂණ කාර්යයන්" සහ "ප්‍රකාශන කාර්යයන්", "පශු වෛද්‍ය කාර්යයන්". "කුලී හා බදු කාර්යයන්", "රැකියා, රැකියා නියෝජිත ආයතන, ආරක්ෂක හා විමර්ශන කාර්යයන්" සහ "ගොඩනැගීම් හා උද්‍යාන සැකසීම සම්බන්ධ සේවා සැපයීම් " යන කාර්යයන්ගෙන් ගෙන් සමන්විත වේ. මෙමගින් දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වය සියයට 1.8ක් පමණ වේ.

"වෙනත් පුද්ගල සේවා කාර්යයන්" දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 9.6ක පමණ දායකත්වයක් සපයන අතර ප්‍රධාන උප ක්‍රියාකාරකම් දෙකකින් සමන්විත වේ. ඒ "කලා හා පොදු විනෝදාත්මක කාර්යයන්" සහ "අනෙකුත් පෞද්ගලික කාර්යයන්" වශයෙනි. ජනතාවගේ සෞඛ්‍ය සුරක්ෂිතතාවය රැකගැනීම සඳහා තවදුරටත් ක්‍රියාත්මකව පවතින සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීමේ ක්‍රියාමාර්ග හේතුවෙන් මෙම ආර්ථික කටයුත්තේ ප්‍රසාරණය කෙරෙහි විශාල සානුබලයක් ආර්ථිකය තුළ තවමත් නොමැති අතර ඒ අනුව 2020 වර්ෂයේ දී මෙහි සියයට 6.5ක පසුබැසීමක් වාර්තා වී ඇත.

## 2.1 2020 වර්ෂයේ සිව්වන කාර්තුවේ ජාතික ගිණුම් ඇස්තමේන්තු

2020 වර්ෂයේ සිව්වන කාර්තුව සඳහා ජාතික ගිණුම් ඇස්තමේන්තු නිකුත් කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2020 වර්ෂයේ සිව්වන කාර්තුවේ ආර්ථිකය සියයට 1.3 කින් වර්ධනය වී ඇති බව වාර්තා කරයි. පෙර වර්සයේ සිව්වන කාර්තුවේ දී මෙම වර්ධනය සියයට 1.6ක් ලෙස වාර්තා විය.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අනාවරණය කරන පරිදි 2020 සිව්වන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය ස්ථාවර මිල(2010) ගණන් යටතේ 2019 වර්ෂයේ වාර්තා වූ රුපියල් මිලියන 2,731,174 සිට රුපියල් මිලියන 2,766,364 දක්වා වැඩිවී ඇත. එසේ ම පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතය 2019 වර්ෂයේ වාර්තා වූ රුපියල් මිලියන 3,836,327 සිට රුපියල් මිලියන 4,034,422 දක්වා සියයට 5.2කින් වැඩිවී ඇත.

2020 වර්ෂයේ සිව්වන කාර්තුවේ දී කෘෂිකාර්මික ආර්ථික කටයුතු සහ කර්මාන්ත ආර්ථික කටයුතු සියයට 1.3 බැගින් වර්ධනය වී ඇති අතර සේවා ආර්ථික කටයුතු සියයට 1.9ක වර්ධනයක් වාර්තා කර ඇත.

2020 සිව්වන කාර්තුවේ දී ආර්ථිකයේ උප ආර්ථික කටයුතු අතුරෙන් විශේෂයෙන් ධාන්‍ය වගා කිරීම(සියයට 44.4), මිරිදිය ධිවර කටයුතු(සියයට 29.7), රබර් වගා කිරීම(සියයට 29.6), අනෙකුත් පානීය බෝග වගා කිරීම (සියයට 23.3), වනද්‍රව්‍ය හා වනවගා (සියයට 19.4), ඛනිජ තෙල් පිරිපහදු කිරීම (සියයට 12.6), රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනය( සියයට 11.4), තොරතුරු තාක්ෂණ සේවා (සියයට 23.0), විදුලි සංදේශ සේවා (සියයට 17.8), මූල්‍ය සේවා (සියයට 14.6) වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. කෙසේ වෙතත් කරදිය ධිවර කටයුතු (සියයට -27.5), රබර් හා ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය (සියයට -12.2), ආහාරපාන හා නවාතැන් පහසුකම් සැපයීම (සියයට -49.1) වශයෙන් සෘණ වර්ධන වේගයන් වාර්තා කර ඇත.

**දැක්ම**

දේශීය සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා කාලීන තොරතුරු ලබා දීම තුළින් කලාපයේ පෙර ගමන්කරු බවට පත්වීම

**මෙහෙවර**

ගෝලීයකරණ පසුබිමක් තුළ සමෘද්ධිමත් ජාතියක් බවට පත්වීම සඳහා නව තාක්ෂණය, සේවක කැපවීම සහ උපායශීලී නායකත්වය තුළින් කාලීන වූත් නිවැරදි වූත් දත්ත ලබා දීම මගින් වඩාත් ඵලදායී ලෙස දේශයෙහි සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**
**සංඛ්‍යාන මන්දිරය**
අංක.306/71,පොල්දූව පාර
**බත්තරමුල්ල**

info@statistics.gov.lk
+94 11 2147000
+94 11 2147011
**statistics.gov.lk**

**මෙය ජාතික ගිණුම් අංශයේ ප්‍රකාශනයකි.**
**සිව්වන මහල, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**
National.accounts@statistics.gov.lk
+94 11 2147071 +94 11 2877938